# මෝටර් රථ රක්ෂණාවරණයක් ලබාගැනීමේදී ඔබ දැනගත යුතු කරුණු





### රක්ෂණීය අයිතිය

වාහනයක රක්ෂණීය අයිතිය ඇත්තේ එහි වත්මන් අයිතිකරු වෙතයි. රක්ෂණාවරණයක් යටතේ හිමිකම් ලැබීමට අයිතියක් ඇත්තේ වාහනයේ රක්ෂණීය අයිතිය ඇති තැනැත්තාටයි. එනම් වාහනයේ වත්මන් අයිතිකරුටය. ඒ අනුව, වාහනයක රක්ෂණාවරණය එහි වත්මන් අයිතිකරුගේ නමින් තිබිය යුතුයි. අනතුරකදී, වාහනයේ පෙර අයිතිකරුගේ නමින් ඇති රක්ෂණාවරණය යටතේ හිමිකම් ලබාගැනීමට ඔබට හැකියාවක් නැත.

### නියම වටිනාකමට රක්ෂණය කරන්න

වාහනයේ වෙළඳපොළ වටිනාකමට රක්ෂණාවරණය ලබාගන්න. මන්ද, රක්ෂණයේ දී හානිය පියවීම (හානිපුරණය) සිදුවන්නේ වෙළඳපොළ වටිනාකම පදනම් කර ගනිමිනි. ඒ අනුව අඩු වටිනාකමකට රක්ෂණය කළහොත් වන්දි අඩුවෙන් ලැබීමට ඉඩ ඇති අතර වැඩි වටිනාකමකට රක්ෂණය කළද, වන්දි ලැබෙන්නේ වෙළඳපොළ වටිනාකමට පමණි.





### වාහනයේ භාවිතයට අදාළ රක්ෂණාවරණය ලබාගන්න

වාහනය භාවිතා කරන්නේ කුමන කාරණාවක් සඳහා ද යන්න, උදාඃ පුද්ගලික, මගී හෝ භාණ්ඩ ප්‍රවාහනය (හයරින් හෝ රෙන්ටින්), රියදුරු පුහුණුව ආදී භාවිතාවන් රක්ෂණ යෝජනා පත්‍රය මගින් සමාගම වෙත හෙළිදරව් කළ යුතු වේ. ගෙවිය යුතු වාරිකය සහ අදාල කොන්දේසි තීරණය වන්නේ වාහනයේ අපේක්ෂිත භාවිතය මත බැවින්, එසේ නොකළහොත් රක්ෂණ වන්දි නොලැබී යා හැක.

### වාරික ගෙවීමේ බැඳුම්කරය

රක්ෂණාවරණය ආරම්භ වන දින සිට දින 60 ක කාලසිමාව ඉකුත්වීමට පෙර සම්පූර්ණ රක්ෂණ වාරිකය ගෙවා නිම කළයුතු බවට රක්ෂණ සමාගම එකඟ වී ඇත්නම්, එම කාල සීමාව ඉකුත්වීමට පෙර එම මුදල ගෙවා නිම කිරීමට වග බලා ගන්න. නැතහොත් දැනුම්දීමකින් තොරව රක්ෂණ ඔප්පුව අවලංගු වන අතර ඒ යටතේ කිසිඳු හිමිකම්පෑමක් කිරීමෙන් වන්දි ලබා ගැනීමට ඔබට නොහැකි වනු ඇත.





### රක්ෂණ සමාගමක් තෝරා ගැනීමේ අයිතිය

රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ලියාපදිංචි වූ රක්ෂණ සමාගමක් (සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ යෙදී සිටින) මගින් ඔබට අවශ්‍ය රක්ෂණාවරණයක් ලබා ගත හැක. යම් නිශ්චිත රක්ෂණ සමාගමකින් රක්ෂණාවරණයක් ලබා ගන්නා ලෙස කිසිවකුටත් ඔබට බල කිරීමේ අයිතිය නැත.

### අනතුරක් වු වහාම දැනුම් දෙන්න

වාහනය අනතුරට ලක් වූ වහාම, ඒ පිළිබඳව අදාළ රක්ෂණ සමාගමට දැනුම් දී හිමිකම් ලබාගැනීම සඳහා අනුගමනය කළ යුතු පියවර පිළිබඳ උපදෙස් ලබාගන්න. රියදුරු විසින් අනතුර පිළිබඳව ලඟම ඇති පොලිස් ස්ථානයට දැනුම්දීම මෝටර් වාහන ආඥා පනත යටතේ අනිවාර්ය කොට ඇත.



ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව 11 වන මහල, නැගෙනහිර කුළුන ලෝක වෙළඳ මධ්‍යස්ථානය කොළඹ 01.
දුරකථන : 0112 396 184-9 / ෆැක්ස් : 0112 396 190-1 / ඊමේල් ලිපිනය : info@ircsl.gov.lk / වෙබ් අඩවිය : www.ircsl.gov.lk